# අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ වෘත්තීය අධ්‍යාපන අමාත්‍යාංශය
# සී/ස නිපුණතා සංවර්ධන අරමුදල

**SDFL**
The Nation's Leader in Skills Development

## තනතුරු පුරප්පාඩු

**අධ්‍යාපන අමාත්‍යාංශය යටතේ පවතින සී/ස නිපුණතා සංවර්ධන අරමුදලේ පහත සඳහන් තනතුරු පුරප්පාඩු පිරවීම සඳහා සුදුසුකම් සපුරා ඇති ශ්‍රී ලංකාවේ පුරවැසියන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.**

## 1. සේවා ගණය: කළමණාකාර (MM 1-1)

**තනතුර : ගණකාධිකාරී** **තනතුරු සංඛ්‍යාව: 01**

### සියලුම අයදුම්කරුවන්

**(අ). අධ්‍යාපන සුදුසුකම්**

විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්වවිද්‍යාලයකින් වාණිජ විද්‍යාව හෝ කළමනාකරණ උපාධියක් ලබා තිබීම.

හෝ

ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනයේ (ICASL) අන්තර් මධ්‍යම පරීක්ෂණය සමත්ව තිබීම.

හෝ

එක්සත් රාජධානියේ වරලත් කළමනාකරණ ගණකාධිකාරී ආයතනයේ (CIMA) අන්තර මධ්‍යම පරීක්ෂණය සමත්ව තිබීම.

හෝ

එක්සත් රාජධානියේ වරලත් සහතිකලත් කළමනාකරණ ගණකාධිකාරී ආයතනයේ (ACCA) අන්තර මධ්‍යම පරීක්ෂණය සමත්ව තිබීම.

හෝ

උසස් ජාතික ගණකාධිකරණ (HNDA) ඩිප්ලෝමාව සමත්ව තිබීම.

සපුරා තිබිය යුතුය.

- **වයස් සීමාව:**

  අවුරුදු 22ට නොඅඩු හා අවුරුදු 45ට නොවැඩි විය යුතුය.
  අභ්‍යන්තර අයදුම්කරුවන්ට උපරිම වයස් සීමාව අදාල නොවේ.

### බාහිර අයදුම්කරුවන්

**(අ). පළපුරුද්ද**

උපාධිය / සුදුසුකම් ලබා ගැනීමෙන් පසු රාජ්‍ය සංස්ථාවක, ව්‍යවස්ථාපිත මණ්ඩලයක හෝ පිළිගත් පෞද්ගලික ආයතනයක අදාළ ක්ෂේත්‍රයේ අවම වශයෙන් වසර තුන (03)ක පළපුරුද්දක් ලබා තිබීම.

### අභ්‍යන්තර අයදුම්කරුවන්

**(අ). පළපුරුද්ද**

උපාධිය / සුදුසුකම් ලබා ගැනීමෙන් පසු කනිෂ්ඨ කළමනාකරණ සේවා ගණයේ තනතුරක අදාළ ක්ෂේත්‍රයේ අවම වශයෙන් වසර තුන (03)ක සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම.

හෝ

තනතුරට පැවරෙන විෂයය ක්ෂේත්‍රයට අදාළ කනිෂ්ඨ කළමණාකාර සේවා ගණයේ II ශ්‍රේණියේ වසර පහ (05)ක සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම.

- **වැටුප් කේතය හා වැටුප් පරිමාණය :**

  MM 1-1-2025-Rs 91,690-10X2,480-15X3,450-168,240

  (වැටුප් ගෙවනු ලබන්නේ කළමණාකරණ සේවා චක්‍රලේඛ 01/2025 උපලේඛන II ට අනුව බව සලකන්න.)

## 2. සේවා ගණය: කනිෂ්ඨ කළමණාකාර (JM 1-1)

**තනතුර : පරිපාලන නිලධාරී** **තනතුරු සංඛ්‍යාව: 01**

### බාහිර අයදුම්කරුවන්

විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්ව විද්‍යාලයකින් ඕනෑම විෂය ක්ෂේත්‍රයකට අදාළව උපාධියක් ලබා තිබීම සමග උපාධිය ලැබීමෙන් පසු රජයේ දෙපාර්තුමේන්තුවක/සංස්ථාවක/ මණ්ඩලයක හෝ පිළිගත් වාණිජ ආයතනයක අදාළ ක්ෂේත්‍රයේ අවම වශයෙන් එක් අවුරුද්දක පළපුරුද්දක් ලබා තිබීම.

### අභ්‍යන්තර අයදුම්කරුවන්

විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්වවිද්‍යාලයකින් ඕනෑම විෂය ක්ෂේත්‍රයකට අදාළව උපාධියක් ලබා තිබීම සමග උපාධිය ලැබීමෙන් පසු අදාල ක්ෂේත්‍රයෙහි "කළමනාකරණ සහකාර" (තාක්ෂණික නොවන) සේවා ගණයේ තනතුරක අවම වශයෙන් වසර එක (01)ක සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම.

**හෝ**

අදාළ ක්ෂේත්‍රයෙහි "කළමනාකරණ සහකාර" (තාක්ෂණික නොවන) සේවා ගණයේ II වන ශ්‍රේණියේ තනතුරක වසර පහ (05)ක සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම.

- **වයස් සීමාව:**

  අවුරුදු 22ට නොඅඩු හා අවුරුදු 45ට නොවැඩි විය යුතුය.
  අභ්‍යන්තර අයදුම්කරුවන්ට උපරිම වයස් සීමාව අදාල නොවේ.

- **වැටුප් කේතය හා වැටුප් පරිමාණය :**

  JM 1-1-2025-Rs 72,650-10X1,360-18X2,040-122,970

  (වැටුප් ගෙවනු ලබන්නේ කළමණාකරණ සේවා චක්‍රලේඛ 01/2025 උපලේඛන II ට අනුව බව සලකන්න.)

---

වෙනත්:

සෑම ඉල්ලුම්කරුවෙක්ම:

I. ශ්‍රී ලංකාවේ පුරවැසියෙකු විය යුතුය.
II. තනතුරට පැවරෙන කාර්යන් මැනවින් ඉටුකිරීම සඳහා මෙන්ම දිවයිනේ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීම සඳහා අවශ්‍ය වන කායික හා මානසික යෝග්‍යතාවයෙන් යුක්ත විය යුතුය.
III. විශිෂ්ඨ චරිතයෙන් යුක්ත විය යුතුය.
IV. මෙම තනතුරු ස්ථිර තනතුරු වන අතර සේවක අර්ථසාධක අරමුදලට සහ සේවා නියුක්තිකයින්ගේ භාරකාර අරමුදලට හිමිකම් කියයි.
V. ඉහත වැටුප් වලට අමතරව රජය විසින් අනුමත ජීවන වියදම දීමනාව සහ විශේෂ දීමනා ගෙවනු ලැබේ.
VI. රාජ්‍ය සේවයේ/ සංස්ථා වල/ ව්‍යවස්ථාපිත මණ්ඩල වල සේවයේ නියුතු අයදුම්කරුවන් එම අයදුම්පත් අදාළ ආයතන ප්‍රධානි මාර්ගයෙන් යොමු කල යුතුය.
VII. සම්මුඛ පරීක්ෂණ සඳහා කැඳවීම පත්වීම බලධරයා විසින් ගනු ලබන තීරණ අනුව සිදු කරනු ලබයි.

සම්පූර්ණ ජීවදත්ත ඇතුලත්ව උප්පැන්න සහතිකය, අනෙකුත් අදාළ අධ්‍යාපනික හා වෘත්තීය සුදුසුකම් සහතික, සේවා සහතික වල පිටපත් සමග ඥාති නොවන නිර්දේශකයන් දෙදෙනෙකුගේ නම් හා ලිපිනයක් සහිතව සකස් කල අයදුම් පත්‍රය ලියාපදිංචි තැපෑලෙන් 2025 අගෝස්තු මස 10 දිනට පෙර පහත දක්වා ඇති ලිපිනයට ලැබීමට සැලැස්විය යුතුය. තැපෑලේදී අස්ථානගත වන හෝ ප්‍රමාද වී ලැබෙන අයදුම්පත් පිළිබඳව සී/ස නිපුණතා සංවර්ධන අරමුදල වග කියනු නොලැබේ. **අයදුම්පත් භාරගන්නා අවසන් දිනයට පසුව මෙම ආයතනයට ලැබෙන අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.** අදාළ අයදුම්පත් බහාලු කවරයේ වම්පස ඉහළ කෙළවරේ අයදුම් කරනු ලබන තනතුර සඳහන් කල යුතුය.


සභාපති,
සී/ස නිපුණතා සංවර්ධන අරමුදල,
"නිපුණතා පියස" 7 වන මහල,
අංක 354/2, ඇල්විටිගල මාවත, කොළඹ 05.

දුරකථන අංකය: 011 250 7274